# සසරේ රඟ



කටුකුරුන්දේ ඤාණානනද භික්ෂු

# සසරේ රඟ

කටුකුරුන්දේ ඤාණනන්ද භික්ෂු

ප්‍රකාශනය
කටුකුරුන්දේ ඤාණනන්ද සදහම් සෙනසුන් භාරය

2020

# ධර්මදානයකි

මුදලට විකිණීම සපුරා තහනම් වෙයි.

ප්‍රථම මුද්‍රණය - 2020 ජනවාරි

## සියලුම හිමිකම් ඇවිරිණි

මුදලට විකිණීම සඳහා හෝ ලාභ ලැබීම පිණිස වන සියලු ආකාරයේ උපුටා ගැනීම්, නැවත පළ කිරීම් සපුරා තහනම්ය. මෙම දහම් පොත ධර්මදානයක් ලෙස නැවත පළ කිරීමට කටුකුරුන්දේ ඤාණනන්ද සදහම් සෙනසුන් භාරය වෙත විමසීම් යොමු කරන්න. ධර්මග්‍රන්ථ සහ දේශනා සඳහා පිවිසෙන්න

www.seeingthroughthenet.net

ISBN 978-624-5061-03-7

විමසීම්

කටුකුරුන්දේ ඤාණනන්ද සදහම් සෙනසුන් භාරය
කිරිල්ලවලවත්ත, දම්මුල්ල, කරඳන.
දුරකථනය: 0777127454
knssb@seeingthroughthenet.net

මුද්‍රණය

කොලිටි ප්‍රින්ටර්ස්
17/2, පැඟිරිවත්ත පාර, ගංගොඩවිල, නුගේගොඩ.
දුරකථනය: 0114870333

# ධර්මදානයකි
## මුදලට විකිණීම සපුරා තහනම් වෙයි.

කතු හිමියන්ගේ දහම් පොත් ලබාගත හැකි ස්ථාන:

1. කටුකුරුන්දේ ඤාණනන්ද සදහම් සෙනසුන
   කිරිල්ලවලවත්ත, දම්මුල්ල, කරඳන.
2. සුනිල් විජේසිංහ මහතා – 39/10, ශාන්ත රීටා පාර, ගල්කිස්ස.
3. හේමමාලා ජයසිංහ මහත්මිය
   29/8, පැඟිරිවත්ත මාවත, මිරිහාන, නුගේගොඩ.
4. චන්දන විජේරත්න මහතා
   23/79A, 1 වන පටුමග, ධර්මපාල පෙදෙස, තලවතුගොඩ.
5. එස්. ඒ. සූරියාරච්චි මහතා
   මොරටු ලීබඩු වෙළඳසැල, කඩ වීදිය, දේවාලේගම.
6. එස්. ඒ. ලයනල් මහතා
   140/19, රුහුණුසිරි උද්‍යානය, හක්මන පාර, මාතර.
7. සිරිමා විජේරත්න මහත්මිය – 15, ඇලපාත, රත්නපුර.
8. මහාචාර්‍ය කේ. එම්. විජේරත්න මහතා, දන්ත විද්‍යා පීඨය,
   පේරාදෙණි විශ්ව විද්‍යාලය, පේරාදෙණිය.
9. වෛද්‍ය පී. වීරසිංහ මහතා
   බණ්ඩාර බුලංකුලම, ලංකාරාම පාර, අනුරාධපුර.
10. ආර්. ඒ. චන්දි රණසිංහ මහත්මිය
    ස්ටුඩියෝ 'චායා', රෝහල හන්දිය, පොළොන්නරුව.
11. නේරා විජේසුන්දර මහත්මිය
    ඉළුක්පිටිය බෙහෙත් ශාලාව, ඉළුක්පිටිය, ගැටහැත්ත.
12. ඩී. සී. ඒ. නිශ්ශංක මහතා – 91A, වුඩ්වර්ඩ් පාර, ගාල්ල.
13. ඩබ්ලිව්. ඒ. සුමිත් ප්‍රියදර්ශන මහතා
    සුමිත් මෝටර්ස් (ස.තො.ස ඉදිරිපිට), 163G, වතුපිටිවල, නිට්ටඹුව.
14. Mr. Janitha Wijesinghe (janithasw@gmail.com)
    47 Putters Circuit, Blacktown, NSW 2148, Australia.
15. Mr. Siyuranga Koswatta (koswatta@gmail.com)
    11 Gleneida Ridge Rd, Carmel, NY 10512, USA.

www.seeingthroughthenet.net

# පටුන


හැඳින්වීම vi

ප්‍රකාශක නිවේදනය ix

අමා ගඟ x

තිණකට්ඨ වග්ගය 1

1. තිණකක්කට්ඨ සූත්‍රය 1
2. පඨවි සූත්‍රය 1
3. අස්සු සූත්‍රය 2
4. මාතුථඤ්ඤදඤ්ඤ සූත්‍රය 4
5. පබ්බත සූත්‍රය 5
6. සාසප සූත්‍රය 6
7. සාවක සූත්‍රය 7
8. ගංගා සූත්‍රය 8
9. දණ්ඩ සූත්‍රය 9
10. ඒකපුග්ගල සූත්‍රය 10

දුග්ගත වග්ගය 11

1. දුග්ගත සූත්‍රය 11
2. සුඛිත සූත්‍රය 11
3. තිංසමත්ත සූත්‍රය 12
4. මාතු සූත්‍ර 14
5. පිතු සූත්‍රය 15
6. භාතු සූත්‍රය 15
7. භගිනි සූත්‍රය 16
8. පුත්ත සූත්‍රය 17
9. ධීතු සූත්‍රය 18
10. වෙපුල්ලපබ්බත සූත්‍රය 18

# හැඳින්වීම

අතිපූජනීය කටුකුරුන්දේ ඤාණනන්ද මාහිමිපාණන් වහන්සේ අවසන් සුසුම් හෙළන්නට දින කිහිපයකට පෙරාතුව සෝදුපත් බලා නිම කළ 'සසරේ රඟ' නැමති මෙම උතුම් ග්‍රන්ථය දහම් පිපාසිතයින් උදෙසා එළිදැක්වීමට ලැබීම අපගේ මහත්වූ භාග්‍යයක්මය.

අප ගුරුදේවයන් වහන්සේ තමන් සතුවූ සුවිශේෂ ධර්මඥානය, උග්‍ර ප්‍රතිපදාවෙන් සහ භාවනාවෙන් අත්විඳ ප්‍රත්‍යක්ෂ කරගත් අවබෝධයෙන් යුත් මහතෙර නමකි. එසේම විවිධ වූ ධර්මපර්යායන් විනිවිද දනිමින් හා දකිමින් තමන් වහන්සේ ලත් එම අවබෝධය, අප කෙරෙහි වූ මහත් අනුකම්පාවෙන් හා කල්‍යාණ මිත්‍රත්වයෙන් අපගේ ප්‍රතිපදාවට හා භාවනාවට යොමුකර 'නිවීම' සඳහාම තම දේශනය හා ලේඛනය උපයෝගි කරගත් මහායතිවරයෙකි.

"මහණෙනි, අවිද්‍යා නීවරණයෙන් වැසී, තණ්හා සංයෝජනයෙන් බැඳී දුවන්නාවූ සැරිසරන්නාවූ සත්ත්වයින්ගේ සිතාගත නොහැකි අග කෙළවරක් ඇති මේ සංසාර ගමනෙහි අතීත කෙළවර නොපෙනේ.

මහණෙනි, මෙසේ ඔබ විසින් දීර්ඝ කාලයක් දුක් අත්විඳින ලදී. දැඩි දුක් විඳින ලදී. ව්‍යසන විඳින ලදී. සොහොන් බිම වඩන ලදී. එබැවින් සියලු සංස්කාරයන් කෙරෙහි කලකිරීමම සුදුසුය. නොඇලීමම සුදුසුය. මිදීමම සුදුසුය."

මෙම ගම්භීර වූ සම්බුද්ධ දේශනය ඔබ අප හැමදෙනාටම සිහිපත් කරදීම අතිපූජනීය කටුකුරුන්දේ ඤාණනන්ද ස්වාමීන් වහන්සේගේ පරමාර්ථය වූ බව අපගේ ගෞරවාන්විත හැඟීමය.

මෙහිදී අපගේ පෞද්ගලික අත්දැකීමක් වශයෙන් සිහිපත් වන්නේ, අප ලොකු ස්වාමීන් වහන්සේ අසරණව දුකට පත් වූ අයෙකු දුටු අවස්ථාවේ, "ආයුෂ්මතුනි, මේ අය මේ මොහොතේදීවත්, සසරේ දුක් සහිත බව, බියකුරු බව වටහාගන්නවානම් ධර්මය දෙසට යොමුවී සසරින් එතෙරවීමට උත්සාහවත් වේවි" යන්න පැවසූ බවයි.

'සසරේ රඟ' නමින් එළිදකින මෙම ග්‍රන්ථය, මරණාසන්නව ලෙඩ ඇඳේ සිටින රෝගියාද දහම්රසය තුලින් ලොව්තුරු සුවයෙන් සැනසීමට දිරිගන්වයි.

දෙස් විදෙස් වැසි සැදැහැවත් පරිත්‍යාගශීලී විශාල පිරිසකගේ නොමසුරු ආධාරයෙන් 'අමා ගඟ' දිනෙන් දින පුළුල් වෙමින් ගලායයි.

එයින් ජනිත පුණ්‍ය ශක්තිය ඔවුන්හට පරම ශාන්ත උතුම් නිර්වාණාවබෝධය පිණිස උපනිශ්‍රය සම්පතක්ම වේවා! මෙම සත්කාර්යයට සහාය වන පින්වත් සිරිමා විජේරත්න සහ ලිලියන් රත්නායක මහත්මීන්ටත්, අපගේ පොතපත ශෝභන ලෙස මුද්‍රණය කරදෙන කොලිටි ප්‍රින්ටර්ස් සමාගමේ සී. ජයසෝම මහතා ඇතුළු සැමටද අපගේ පුණ්‍යානුමෝදනාව හිමිවේ.

මෙයට,
සසුන් ලැදි
මිල්ලතේ සුභූති භික්ෂු

කටුකුරුන්දේ ඤාණනන්ද සදහම් සෙනසුන
කිරිල්ලවල වත්ත, දම්මුල්ල
කරඳන
(2563) 2020 ජනවාරි

# කටුකුරුන්දේ ඤාණනන්ද සදහම් සෙනසුන් භාරය
# ප්‍රකාශක නිවේදනය

'කටුකුරුන්දේ ඤාණනන්ද සදහම් සෙනසුන් භාරය' පූජ්‍ය කටුකුරුන්දේ ඤාණනන්ද ස්වාමීන් වහන්සේ විසින් සම්පාදිත සියලුම ධර්මග්‍රන්ථ හා දේශිත ධර්ම දේශනා පිරිසිදු ධර්මදානයක් වශයෙන්ම ධර්ම පිපාසිත ලෝකයාහට ප්‍රදානය කිරීමේ උන්වහන්සේගේ අභිමතාර්ථය ඉටු කිරීමට ඇප කැප වී සිටියි. මේ අනුව ධර්මග්‍රන්ථ මුද්‍රණය සහ බෙදාහැරීම පිළිබඳ කාර්යභාරයත්, ධර්ම දේශනා සංයුක්ත තැටිගත කිරීම සහ www.seeingthroughthenet.net වෙබ් අඩවිය, www.facebook.com/seeingthrough සමාජ ජාල අඩවිය පවත්වාගෙන යාමත් කටුකුරුන්දේ ඤාණනන්ද සදහම් සෙනසුන් භාරයේ වගකීම වනු ඇත.

දෙස් විදෙස් වැසි ධර්මකාමී පාඨක ශ්‍රාවක විශාල පිරිසක් වෙනුවෙන් ක්‍රියාත්මක වන මෙම පුළුල් ධර්මදාන වැඩ පිළිවෙලට දායකවීමට කැමති පින්වතුන්හට පහත සඳහන් බැංකු ගිණුමට තම ආධාර මුදල් යොමුකිරීමට අවස්ථාව ඇත.

මෙම ධර්මදාන වැඩපිළිවෙලට ආධාර එවීම පිළිබඳ සියලු විමසීම්:

කටුකුරුන්දේ ඤාණනන්ද සදහම් සෙනසුන් භාරය
කිරිල්ලවල වත්ත, දම්මුල්ල, කරඳන.
දුරකථන අංක: 0777127454
ඊමේල් ලිපිනය: knssb@seeingthroughthenet.net
ආධාර මුදල් යොමු කිරීම:

කටුකුරුන්දේ ඤාණනන්ද සදහම් සෙනසුන් භාරය (K.N.S.S.B)
ගිණුම් අංක: 007060000241
සම්පත් බැංකුව, SWIFT: BSAMLKLX
ශාඛා අංකය: 070
ශාඛාව: ආර්. ජී. සේනානායක මාවත, කොළඹ - 07.

# අමා ගඟ

මහවැලි ගඟ උතුරට හැරැවීමෙන් පසු එතෙක් නිසරු මුඩු බිම් ලෙස පැවති පෙදෙස්වල සිදුවූයේ ඉමහත් වෙනසෙකි. පිපාසයට පැන් බිඳක් නොලබා සිටි ගොවීහු පෙදෙස පුරා නිහඬව ගලා යන සිසිල් දිය දහරින් පිනා ගියහ. මැලවුණු ගොයම සරුව නිල්වන්ව කරලින් බර විය. මල් පලින් ගැවසීගත් තුරු-ලිය බලා සැනසෙන පෙදෙස් වැසියෝ තුටු කඳුළු වගුළහ.

දහම් අමා ගඟ 'උතුරට' හැරැවීමේ වැඩ පිළිවෙළක් මෙයට තෙවසරකට පෙර ඇරඹුණි. දහම් පත-පොත තබා 'එදා-වේල' සඳහා වත් වියපැහැදම් කිරීමට වත්-කමක් නැත්තෝ, නිහඬව නොමිලයේ ගලායන අමිල දහම් අමා දිය දහරින් සදහම් පිපාසය සන්සිඳුවා ගත්හ. අරිටු මිසදිටු හැර, සැදැහැයෙන් සරුව, ගුණ නුවණින් බරව පිළිවෙත් මගට නැමී ගත්හ. ලොවී-ලොවුතුරු මල් පල නෙළා ගනිමින් හද පුරා පිරි බැතියෙන් නන් අයුරින් සොම්නස පළකළහ.

'ධර්මග්‍රන්ථ මුද්‍රණ භාරය' නමින් දියත් කළ මෙම ධර්මදාන වැඩපිළිවෙළ සඳහා අපගෙන් වැයවුණේ පිරිසිදු ධර්මදාන සංකල්පය පමණි. අමාගඟ 'උතුරට' හැරැවූවෝ සසුන් ගුණ හඳුනන පරිත්‍යාගශීලී සැදැහැවත්හුමය. 'නිවනේ නිවීම' පොත් පෙළ එළිදැක්වීමෙන් නොනැවතී 'පහන් කණුව ධර්මදේශනා' පොත් පෙළෙහි 'බර පැන' දැරීමටත්, දෙස්-විදෙස්වල දහම් පිපාසිතයින් උදෙසා අප අතින් ලියැවෙන අනිකුත් පොත-පත ඒ අයුරින්ම එළිදැක්වීමටත් ඔවුහු උත්සුකවූහ. 'දෙන දේ පිරිසිදුවම දීමේ' අදහසින් අමිලවූ දහම ඊට නිසි ශෝභන මුද්‍රණයකින්ම ධර්මකාමීන් අතට පත් කිරීමට පියවර ගත්හ. මුද්‍රිත පිටපත් සංඛ්‍යාව අවසන්වනු හා සමගම 'නැවත මුද්‍රණ' පළකිරීමෙන් දහම් අමා ගඟ වියළී යා නොදීමට දැඩි අදිටනකින් ඇප කැපවූහ.

'පොත් අලෙවිය' පිළිබඳව මෙකළ බහුලව දක්නට ලැබෙන වාණිජ සංකල්පයට පිටුපා, තහංචි වලින් තොරව, තමන් අතට නොමිලයේම පත් කැරෙන 'දහම් පඬුර' තුළින් ධර්මදාන සංකල්පයෙහි අගය වටහාගත් බොහෝ පාඨක පින්වත්හු තමන් ලද රස අහරක්, නෑ-හිතවතුන් සමග බෙදා-හදා ගන්නාක් මෙන් නොමසුරුව අන් දහම් ළැදියනටද දී ධර්මදානයට සහභාගීවූහ. ඉනුදු නොනැවතී, ශක්ති පමණින් 'ධර්මග්‍රන්ථ මුද්‍රණභාරයට' උරදීමටද ඉදිරිපත්වූහ. ඇතැමෙක් ලොකු කුඩා

දහම් පොත් මුද්‍රණය කරවීමේ හා නැවත-නැවත මුද්‍රණය කරවීමේ බරපැන ඉසිලීමට පවා පසුබට නොවූහ.

සම්බුදු සසුන මේ ලක් පොළොවෙහි පවතින තාක් මේ දහම් අමාගඟ ලෝ සතුන් සිත් සනහමින් නොසිඳී ගලා යේවා යනු අපගේ පැතුමයි.

'සබ්බදානං ධම්මදානං ජිනාති'

මෙයට,
සසුන් ලැදි
කටුකුරුන්දේ ඤාණනන්ද භික්ෂු

පොත්ගුල්ගල ආරණ්‍ය සේනාසනය
'පහන් කණුව'
කන්දේගෙදර, දේවාලේගම.
2000 ජුනි 05 (2544 පොසොන්)

# සසරේ රඟ

ප්‍රථම මුද්‍රණය

පිටපත් 1000 කින් යුත් මෙම ප්‍රථම මුද්‍රණය ධර්මදාන වශයෙන් පාඨකයින් අතට පත්කරන සාරංගී උමේෂා මහත්මියට, එම ධර්මදානමය කුශලය පරම ශාන්ත උතුම් නිර්වාණාවබෝධය පිණිස උපනිශ්‍රය සම්පතක්ම වේවායි පතමු.

– අනුශාසක
(2563) - 2020 ජනවාරි

# පුණ්‍යානුමෝදනාව

සම්මා සම්බුදුපියාණන් වහන්සේ වදාළ ‘නිවන් මග’ අතිපූජ්‍ය කටුකුරුන්දේ ඤාණනන්ද මහා ස්වාමීන්වහන්සේගේ ග්‍රන්ථකරණය මගින් වඩාත් ප්‍රකට වන හෙයින් ශ්‍රද්ධාවෙන් මෙම මුද්‍රණයට දායකවීමි.

මෙවන් උතුම් කළණමිතුරු ඇසුර භවගමන කෙළවර වනතෙක් ලැබේවායි පතමු.

– සාරංගී උමේෂා

# අනමතග්ග සංයුත්තය

# අනමතග්ග සංයුත්තය - තිණකට්ඨ වග්ගය

## 1. තිණකට්ඨ සූත්‍රය

මා විසින් මෙසේ අසන ලදී

එක් සමයෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර අනාථ පිණ්ඩික සිටුහුගේ ජේතවන නම් ආරාමයෙහි වැඩ වසන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ "මහණෙනි"යි භික්ෂූන් ඇමතූ සේක. ඒ භික්ෂූහු "ස්වාමීනි"යි පිළිතුරු දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළ සේක.

"මහණෙනි, අවිද්‍යා නීවරණයෙන් වැසී, තණ්හා සංයෝජනයෙන් බැඳී දුවන්නාවූ, සැරිසරන්නාවූ, සත්ත්වයින්ගේ සිතාගත නොහැකි අග කෙළවරක් ඇති මේ සංසාර ගමනෙහි අතීත කෙළවර නොපෙනේ. යම්සේ, මහණෙනි, පුරුෂයෙක්, මේ දඹදිව ඇති යම්තාක් තණ, දඬු, අතු හා කොළ වේ නම් ඒ සියල්ල සිඳ එක්රැස්කොට සතරඟුල්, සතරඟුල් කැලි කපා 'මේ මාගේ මවය, මේ මාගේ මවගේ මවය', යනාදී වශයෙන් කියමින් ගොඩක් ගසන්නේද, ඔහුගේ මවගේ මව්වරු අවසන් නොවෙත්. එහෙත් මේ දඹදිව ඇති සියලු තණ, දඬු, අතු හා කොළ අවසන් වේ, නිමාවේ. ඒ කවර හෙයින්ද?

මහණෙනි, අවිද්‍යා නීවරණයෙන් වැසී, තණ්හා සංයෝජනයෙන් බැඳී දුවන්නාවූ සැරිසරන්නාවූ සත්ත්වයින්ගේ සිතාගත නොහැකි අග කෙළවරක් ඇති මේ සංසාර ගමනෙහි අතීත කෙළවර නොපෙනේ.

මහණෙනි, මෙසේ ඔබ විසින් දීර්ඝ කාලයක් දුක් අත්විඳින ලදී. දැඩි දුක් විඳින ලදී. ව්‍යසන විඳින ලදී. සොහොන් බිම වඩන ලදී. එබැවින් සියලු සංස්කාරයන් කෙරෙහි කලකිරීමම සුදුසුය. නොඇලීමම සුදුසුය. මිදීමම සුදුසුය."

## 2. පඨවි සූත්‍රය

මා විසින් මෙසේ අසන ලදී.

එක් සමයෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර අනාථ පිණ්ඩික සිටුහුගේ ජේතවන නම් ආරමයෙහි වැඩ වසන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ "මහණෙනි"යි භික්ෂූන් ඇමතූ සේක. ඒ භික්ෂූහු "ස්වාමීනි"යි පිළිතුරු දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළ සේක.

"මහණෙනි, අවිද්‍යා අවරණයෙන් වැසී, තණ්හා සංයෝජනයෙන් බැඳී දුවන්නාවූ සැරිසරන්නාවූ සත්ත්වයින්ගේ සිතාගත නොහැකි අග කෙළවරක් ඇති මේ සංසාර ගමනෙහි අතීත කෙළවර නොපෙනේ. මහණෙනි, යම් සේ පුරුෂයෙක් මේ මහ පොළොව ඩෙබර ඇට, ඩෙබර ඇට පමණට ගුළිකොට "මේ මාගේ පියාය, මේ මාගේ පියාගේ පියාය", ආදී වශයෙන් කියමින් තබන්නේද, ඒ පුරුෂයාගේ පියාගේ පියවරු අවසන් නොවෙත්. එහෙත් මේ මහ පොළොව අවසන් වේ. නිමාවේ. ඒ කවර හෙයින්ද?

මහණෙනි, අවිද්‍යා නීවරණයෙන් වැසී, තණ්හා සංයෝජනයෙන් බැඳී දුවන්නාවූ සැරිසරන්නාවූ සත්ත්වයින්ගේ සිතාගත නොහැකි අග කෙළවරක් ඇති මේ සංසාර ගමනෙහි අතීත කෙළවර නොපෙනේ.

මහණෙනි, මෙසේ ඔබ විසින් දීර්ඝ කාලයක් දුක් අත්විඳින ලදී. දැඩි දුක් විඳින ලදී. ව්‍යසන විඳින ලදී. සොහොන් බිම වඩන ලදී. එබැවින් සියලු සංස්කාරයන් කෙරෙහි කලකිරීමම සුදුසුය. නොඇලීමම සුදුසුය. මිදීමම සුදුසුය."

## 3. අස්සු සූත්‍රය

මා විසින් මෙසේ අසන ලදී.

එක් සමයෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර අනාථ පිණ්ඩික සිටුහුගේ ජේතවන නම් ආරාමයෙහි වැඩවසන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ "මහණෙනි"යි භික්ෂූන් ඇමතූ සේක. ඒ භික්ෂූහු "ස්වාමීනි"යි පිළිතුරු දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළ සේක.

"මහණෙනි, අවිද්‍යා නීවරණයෙන් වැසී, තණ්හා සංයෝජනයෙන් බැඳී දුවන්නාවූ සැරිසරන්නාවූ සත්ත්වයින්ගේ සිතාගත නොහැකි අග කෙළවරක් ඇති මේ සංසාර ගමනෙහි අතීත කෙළවර නොපෙනේ.

මහණෙනි, ඔබ කුමක් සිතන්නාහුද? ඔබ දීර්ඝ කාලයක් දුවන සැරිසරන අතර, අමනාපයන් හා එක්වීම නිසාත් මනාපයන්ගෙන් වෙන්වීම නිසාත් හැඬීමෙන් හා වැළපීමෙන් ඔබ දෙනෙතින් ගැලූ කඳුලක් වේද, සතර මහා සාගරයේ යම් ජලයක් වේද, මේ දෙක අතරින් කුමක් වනාහි වැඩි වේද?"

"ස්වාමීනි, අප ඔබ වහන්සේගෙන් ධර්මය අසා දැනගත් පරදි අප දීර්ඝ කාලයක් සසර දුවන සැරිසරන අතර අමනාපයන් හා එක්වීමෙන්ද, මනාපයන්ගෙන් වෙන්වීමෙන්ද, හඬා වැලපී වැගිරූ කඳුළුම වැඩිය. සිව් මහා සාගරයේ ජලය (ඊට) වඩා වැඩි නොවේ."

"යහපති! යහපති! මහණෙනි, ඔබ මා විසින් දෙසන ලද ධර්මය තේරුම්ගත් අයුරු යහපත් ය. ඒකාන්තයෙන්ම මහණෙනි, දීර්ඝ කාලයක් දුවන සැරිසරන අතර අමනාපයන් හා එක්වීමෙන්ද, මනාපයනගෙන් වෙන්වීමෙන්ද, ඔබ හඬා වැළපී වැගිරූ කඳුළුම අධිකතරය. සිව් මහා සාගරවල ජලය නොවේ.

මහණෙනි, ඔබ විසින් දීර්ඝ කාලයක් මවු මළ දුක විඳින ලදී. ඒ මවු මළ දුක විඳින්නාවූද, අමනාපයන් හා එක්වීමෙන්ද, මනාපයන්ගෙන් වෙන් වීමෙන්ද, හඬන වැළපෙන ඔබගෙන් වැගිරුණු කඳුළුම ඉතා වැඩිය. සිව් මහා සාගරයේ ජලය (ඊට) වැඩි නොවේ.

මහණෙනි, ඔබ විසින් දිගු කලක්

පියා මළ දුක විඳින ලදී... සහෝදරයා මළ දුක විඳින ලදී... සහෝදරිය මළ දුක විඳින ලදී... පුත්‍රයා මළ දුක විඳින ලදී... දියණිය මළ දුක විඳින ලදී... නෑයන්ට වූ ව්‍යසන විඳින ලදී... වස්තු විනාශ දුක විඳින ලදි... රෝග පීඩා දුක විඳින ලදී... ඒ දුක විඳින්නාවූ ඔබ අමනාපයන් හා එක්වීම නිසාත් මනාපයන්ගෙන් වෙන්වීම නිසාත් හැඬීමෙන් හා වැලපීමෙන් වැගිරවූ කඳුළුම ඉතාම වැඩිය. සතර මහා සාගරවල ජලය (ඊට) වැඩි නොවේ. ඒ කවර හෙයින්ද?

මහණෙනි, අවිද්‍යා නීවරණයෙන් වැසී, තණ්හා සංයෝජනයෙන් බැඳී දුවන්නාවූ සැරිසරන්නාවූ සත්ත්වයින්ගේ සිතාගත නොහැකි අග කෙළවරක් ඇති මේ සංසාර ගමනෙහි අතීත කෙළවර නොපෙනේ.

මහණෙනි, මෙසේ ඔබ විසින් දීර්ඝ කාලයක් දුක් අත්විඳින ලදී. දැඩි දුක් විඳින ලදී. ව්‍යසන විඳින ලදී. සොහොන් බිම වඩන ලදී. එබැවින් සියලු සංස්කාරයන් කෙරෙහි කලකිරීමම සුදුසුය. නොඇලීමම සුදුසුය. මිදීමම සුදුසුය."

## 4. මාතුථඤ්ඤද සූත්‍රය

මා විසින් මෙසේ අසන ලදී.

එක් සමයෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර අනාථපිණ්ඩික සිටුහුගේ ජේතවන නම් ආරාමයෙහි වැඩවසන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ "මහණෙනි"යි භික්ෂූන් ඇමතූ සේක. ඒ භික්ෂූහු "ස්වාමීනි"යි පිළිතුරු දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළ සේක.

මහණෙනි, අවිද්‍යා නීවරණයෙන් වැසී, තණ්හා සංයෝජනයෙන් බැඳී දුවන්නාවූ සැරිසරන්නාවූ සත්ත්‍වයින්ගේ සිතාගත නොහැකි අග කෙළවරක් ඇති මේ සංසාර ගමනෙහි අතීත කෙළවර නොපෙනේ.

මහණෙනි, ඔබ කුමක් සිතන්නාහුද? මේ දීර්ඝ කාලය තුළ දුවන සැරිසරන අතර ඔබ විසින් පානය කරන ලද යම් මව් කිරක් වේද, සතර මහා සාගරයේ යම් ජලයක් වේද, මේ දෙක අතරින් කුමක් වනාහි අධිකතර වේද?"

"ස්වාමීනි, අප ඔබ වහන්සේගෙන් ධර්මය අසා දැනගත් පරිදි අප දීර්ඝ කාලයක් සසර දුවන සැරිසරන අතර අප විසින් පානය කරන ලද යම් මව් කිරක් වේද, එයම වඩා වැඩිය. සතර මහා සාගරවල ජලය (ඊට) වඩා වැඩි නොවේ. "

"යහපති! යහපති! මහණෙනි. ඔබ මා විසින් දෙසන ලද ධර්මය තේරුම් ගත් අයුරු යහපත්ය. ඒකාන්තයෙන්ම මහණෙනි, දීර්ඝ කාලයක් දුවන සැරිසරන අතර, ඔබ විසින් පානය කරන ලද මව්කිරම වඩා වැඩිය. සතර මහා සාගරවල ජලය (ඊට) වැඩි නොවේ. ඒ කවර හෙයින්ද?

මහණෙනි, අවිද්‍යා නීවරණයෙන් වැසී, තණ්හා සංයෝජනයෙන් බැඳී දුවන්නාවූ සැරිසරන්නාවූ සත්ත්‍වයින්ගේ සිතාගත නොහැකි අග කෙළවරක් ඇති මේ සංසාර ගමනෙහි අතීත කෙළවර නොපෙනේ.

මහණෙනි, මෙසේ ඔබ විසින් දීර්ඝ කාලයක් දුක් අත්විඳින ලදී. දැඩි දුක් විඳින ලදී. ව්‍යසන විඳින ලදී. සොහොන් බිම වඩන ලදී. එබැවින් සියලු සංස්කාරයන් කෙරෙහි කලකිරීමම සුදුසුය. නොඇලීමම සුදුසුය. මිදීමම සුදුසුය."

## 5. පබ්බත සූත්‍රය

මා විසින් මෙසේ අසන ලදී.

එක් සමයෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර අනාථ පිණ්ඩික සිටුහුගේ ජේතවන නම් ආරාමයෙහි වැඩවසන සේක. එහි දී එක්තරා භික්ෂුවක් භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹ වැඳ එකත් පසෙක හිඳ මෙසේ විමසුවේය. "ස්වාමීනි, කල්පය වනාහි කෙතරම් දීර්ඝ වේද?"

"මහණ, කල්පය වනාහී ඒකාන්තයෙන්ම ඉතා දීර්ඝය. එය වසර මෙපමණ යැයි හෝ සයක් වසර මෙපමණ යැයි හෝ සියදහස් වසර මෙපමණ යැයි හෝ ගණනය කිරීම පහසු නැත."

"ස්වාමීනි, උපමාවකින් එය දක්විය හැකිද?" "හැකිය මහණ" භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක. "මහණ යම්සේ දිගින් යොදුනක්වූ උසින් යොදුනක්වූ සිදුරු රහිත කඩතොලු රහිත විශාල තනිගල් පර්වතයක් වේද, යම් පුරුෂයෙක් වසර සියයකට වරක් බැගින් කසී සළුවකින් එම ගල් පර්වතය පිරිමදින්නේද, මේ උපක්‍රමයෙන් ඒම හා ගල් පර්වතය ගෙවීයාමට, අවසන් වීමට යන්නේය. (එහෙත්) කල්පය අවසන් නොවේමය.

මහණ, කල්පය වනාහී මෙසේ දීර්ඝය. එවැනි දීර්ඝවූ කල්පයන් අතරින් ගෙවී ඇත්තේ එක් කල්පයක් පමණක් නොවේ. කල්ප සිය දහස් ගණන් නොවේ. දහස් ගණන් නොවේ. සිය දහස් ගණන් නොවේ. ඒ කවර හෙයින්ද?

මහණෙනි, අවිද්‍යා නීවරණයෙන් වැසී, තණ්හා සංයෝජනයෙන් බැඳී දුවන්නාවූ සැරිසරන්නාවූ සත්ත්වයින්ගේ සිතාගත නොහැකි අග කෙළවරක් ඇති මේ සංසාර ගමනෙහි අතීත කෙළවර නොපෙනේ.

මහණෙනි, මෙසේ ඔබ විසින් දීර්ඝ කාලයක් දුක් අත්විඳින ලදී. දැඩි දුක් විඳින ලදී. ව්‍යසන විඳින ලදී. සොහොන් බිම වඩන ලදී. එබැවින් සියලු සංස්කාරයන් කෙරෙහි කලකිරීමම සුදුසුය. නොඇලීමම සුදුසුය. මිදීමම සුදුසුය."

## 6. සාසප සූත්‍රය

මා විසින් මෙසේ අසන ලදී.

එක් සමයෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර අනාථපිණ්ඩික සිටුහුගේ ජේතවන නම් ආරාමයෙහි වැඩවසන සේක. එහිදී එක්තරා භික්ෂුවක් භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹ වැඳ එකත් පසෙක හිඳ මෙසේ විමසුවේය. "ස්වාමීනි, කල්පය වනාහි කෙතරම් දීර්ඝ වේද?"

"මහණ, කල්පය වනාහි ඒකාන්තයෙන්ම දීර්ඝය. එය වසර වශයෙන් හෝ සියක් වසර වශයෙන් හෝ දහස් වසර වශයෙන් හෝ සියදහස් වසර වශයෙන් හෝ ගණනය කිරීම පහසු නැත."

"ස්වාමීනි, උපමාවකින් එය දැක්විය හැකිද?" "හැකිය, මහණ" යයි භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක. "මහණ, යම්සේ දිගින් යොදුනක්වූ පළලින් යොදුනක්වූ උසින් යොදුනක්වූ අබ පුරවා මුදුන් කරනු ලැබූ, යකඩ ප්‍රාකාරයකින් යුත් නගරයක් වේද, යම් පුරුෂයෙක් වසර සියයකට වරක් එක් අබ ඇටය, අබ ඇටය බැගින් ඉවත දමන්නේ වේද, මේ උපක්‍රමයෙන් ඒම හා අබ ගොඩ අවසන් වීමට යම් කාලයක් ගතවේද, කල්පය එයිනුදු අවසන් නොවේ. මහණ කල්පය එපමණ දිගය. එවැනි දීර්ඝවූ කල්පයන් අතරින් ගෙවී ඇත්තේ එක් කල්පයක් පමණක් නොවේ. කල්ප සිය ගණන් නොවේ. දහස් ගණන් නොවේ. ඒ කවර හෙයින්ද?

මහණෙනි, අවිද්‍යා නීවරණයෙන් වැසී, තණ්හා සංයෝජනයෙන් බැඳී දුවන්නාවූ සැරිසරන්නාවූ සත්ත්වයින්ගේ සිතාගත නොහැකි අග කෙළවරක් ඇති මේ සංසාර ගමනෙහි අතීත කෙළවර නොපෙනේ.

මහණෙනි, මෙසේ ඔබ විසින් දීර්ඝ කාලයක් දුක් අත්විඳින ලදී. දැඩි දුක් විඳින ලදී. ව්‍යසන විඳින ලදී. සොහොන් බිම වඩන ලදී. එබැවින් සියලු සංස්කාරයන් කෙරෙහි කලකිරීමම සුදුසුය. නොඇලීමම සුදුසුය. මිදීමම සුදුසුය."

## 7. සාවක සූත්‍රය

මා විසින් මෙසේ අසන ලදී.

එක් සමයෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර අනාථපිණ්ඩික සිටුහුගේ ජේතවන නම් ආරාමයෙහි වැඩවසන සේක. එකල්හි බොහෝ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹ, වැඳ එකත් පසෙක හිඳ මෙසේ කීහ.

"ස්වාමීනි, කොපමණ බොහෝවූ කල්පයෝ අතීතයට එක්වූවාහුද? ගෙවී ගියාහුද?"

"මහණෙනි, අතීතයට එක්වුනාවූ, ගෙවී ගියාවූ කල්පයෝ වනාහි බොහෝය. ඒ ගෙවී ගියාවූ කල්පයන් මෙතෙකැයි කියා සියක් කල්ප වශයෙන් හෝ දහසක් කල්ප වශයෙන් හෝ සිය දහසක් කල්ප වශයෙන් හෝ ගණනය කිරීමට පහසු නැත."

"ස්වාමීනි, උපමාවකින් එය දක්විය හැකිද?"

"හැකිය, මහණෙනි" යි භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක. "මහණෙනි, මේ සසුනෙහි වසර සියයක් ආයුෂ ඇති වසර සියයක් ජීවත් විය හැකි ශ්‍රාවකයෝ සතර දෙනෙක් ඇත්තාහ. ඔවුහු දිනපතා කල්ප සිය දහස බැගින් සිහි කරන්නාහ. එහෙත් ඔවුන්ට සියලු කල්ප සිහිකර නිමකළ නොහැක්කේමය.

මක්නිසාද, එම ශ්‍රාවකයෝ වසර සියයක් අවසානයේ කළුරිය කරන බැවිනි. මහණෙනි, මෙසේ අතීතයට එක් වුනාවූ, ගෙවී ගියාවූ කල්පයෝ බොහෝය. ඒ ගෙවී ගියාවූ කල්පයන් මෙතෙකැයි කියා සියක් කල්ප වශයෙන් හෝ සිය දහස් කල්ප වශයෙන් හෝ ගණනය කිරීම පහසු නැත. ඒ කවර හෙයින්ද?

මහණෙනි, අවිද්‍යා නීවරණයෙන් වැසී, තණ්හා සංයෝජනයෙන් බැඳී දුවන්නාවූ සැරිසරන්නාවූ සත්ත්වයින්ගේ සිතාගත නොහැකි අග කෙළවරක් ඇති මේ සංසාර ගමනෙහි අතීත කෙළවර නොපෙනේ.

මහණෙනි, මෙසේ ඔබ විසින් දීර්ඝ කාලයක් දුක් අත්විඳින ලදී. දැඩි දුක් විඳින ලදී. ව්‍යසන විඳින ලදී. සොහොන් බිම වඩන ලදී. එබැවින් සියලු සංස්කාරයන් කෙරෙහි කලකිරීමම සුදුසුය. නොඇලීමම සුදුසුය. මිදීමම සුදුසුය."

## 8. ගංගා සූත්‍රය

මා විසින් මෙසේ අසන ලදී.

එක් සමයෙක භාග්‍යවතුන් වහන්සේ රජගහ නුවර කලන්දක නිවාප නම්වූ වේළුවනයෙහි (උණ වනයෙහි) වැඩවසන සේක. එහිදී එක්තරා බමුණෙක් භාග්‍යවතුන් වහන්සේ කරා පැමිණ එකත්පසෙක හිඳ මෙසේ විමසුවේය.

"භවත් ගෞතමයෙනි, කොපමණ බොහෝවූ කල්පයෝ අතීතයට එක්වූවාහුද? ගෙවී ගියාහුද?"

"බමුණ, අතීතයට එක් වුනාවූ, ගෙවී ගියාවූ කල්පයෝ වනාහි බොහෝය. ඒ ගෙවී ගියාවු කල්පයන් මෙතෙකැයි කියා සියක් කල්ප වශයෙන් හෝ දහසක් කල්ප වශයෙන් හෝ සියදහසක් කල්ප වශයෙන් හෝ ගණනනය කිරීමට පහසු නැත."

"භවත් ගෞතමයනි, උපමාවකින් එය දැක්විය හැකිද?" "හැකිය, බමුණ"යි භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක. "බමුණ, යම්සේ මේ ගංගා නදිය යම් තැනකින් පැන නගීද, යම් තැනකින් මහා සමුද්‍රයට පිවිසේද, ඒ අතර ඇති වැලි මෙතෙකැයි කියා වැලි ඇට සිය ගණනින් හෝ දහස් ගණනින් හෝ සියදහස් ගණනින් හෝ ගණනය කිරීම පහසු නැත. බමුණ, අතීතයට එක්වුනාවු ගෙවී ගියාවු කල්පයෝ ඊට වඩා අධිකතරය. ඒ කවර හෙයින්ද?

මහණෙනි, අවිද්‍යා නීවරණයෙන් වැසී, තණ්හා සංයෝජනයෙන් බැඳී දුවන්නාවූ සැරිසරන්නාවූ සත්ත්වයින්ගේ සිතාගත නොහැකි අග කෙළවරක් ඇති මේ සංසාර ගමනෙහි අතීත කෙළවර නොපෙනේ.

මහණෙනි, මෙසේ ඔබ විසින් දීර්ඝ කාලයක් දුක් අත්විඳින ලදී. දැඩි දුක් විඳින ලදී. ව්‍යසන විඳින ලදී. සොහොන් බිම වඩන ලදී. එබැවින් සියලු සංස්කාරයන් කෙරෙහි කලකිරීමම සුදුසුය. නොඇලීමම සුදුසුය. මිදීමම සුදුසුය."

"භවත් ගෞතමයන් වහන්ස, ඉතා යහපති, භවත් ගෞතමයන් වහන්ස, ඉතා යහපති. යටිකුරු කරන ලද බඳුනක් උඩුකුරු කරන්නේද, වැසුනාවූ බඳුනක වැස්ම හරින්නේද, මංමුළා වූවෙකුට මඟ පෙන්වන්නේද, ඇස් ඇත්තෝ රූප දකිත්වා'යි තෙල් පහනක් දල්වන්නේද, එපරිද්දෙක් භවත් ගෞතමයන් වහන්සේ නොයෙක්

ආකාරයෙන් ධර්මය දෙසූ සේක. ස්වාමීනි, ඒ ධර්මය ඇසූ මම ඔබ වහන්සේ සරණකොට යමි. ධර්මය සරණකොට යමි. සංඝයා සරණ කොට යමි. භවත් ගෞතමයන් වහන්සේ අද පටන් දිවිහිමියෙන් සරණ ගිය උපාසකයකු ලෙස මා සලකන සේක්වා!"

## 9. දණ්ඩ සූත්‍රය

මා විසින් මෙසේ අසන ලදී.

එක් සමයෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර අනාථපිණ්ඩික සිටුහුගේ ජේතවන නම් ආරාමයෙහි වැඩවසන සේක. එහිදි භාග්‍යවතුන් වහන්සේ "මහණෙනි"යි භික්ෂූන් ඇමතූ සේක. ඒ භික්ෂූහු "ස්වාමීනි"යි පිළිතුරු දුන්හ.

භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළ සේක.

"මහණෙනි, අවිද්‍යා නීවරණයෙන් වැසී, තණ්හා සංයෝජනයෙන් බැඳී දුවන්නාවූ සැරිසරන්නාවූ සත්ත්වයින්ගේ සිතාගත නොහැකි අග කෙළවරක් ඇති මේ සංසාර ගමනෙහි අතීත කෙළවර නොපෙනේ.

යම්සේ මහණෙනි, උඩ අහසට වීසි කරනු ලැබූ දණ්ඩක් වරෙක මුල බිම ගැටී වැටෙයි. වරෙක මැද බිම ගැටී වැටෙයි. වරෙක අගද බිම ගැටී වැටෙයි. එපරිද්දෙන්ම මහණෙනි, අවිද්‍යා නීවරණයෙන් වැසී, තණ්හා සංයෝජනයෙන් බැඳී, දුවන්නාවු සැරිසරන්නාවු සත්ත්වයන්ගේ මේ සංසාර ගමනෙහිදි ඔවුහු වරෙක මෙලොවින් පරලොවට යෙති. වරෙක පරලොවින් මෙලොවට එති. ඒ කවර හෙයින්ද?

මහණෙනි, අවිද්‍යා නීවරණයෙන් වැසී, තණ්හා සංයෝජනයෙන් බැඳී දුවන්නාවූ සැරිසරන්නාවූ සත්ත්වයින්ගේ සිතාගත නොහැකි අග කෙළවරක් ඇති මේ සංසාර ගමනෙහි අතීත කෙළවර නොපෙනේ.

මහණෙනි, මෙසේ ඔබ විසින් දීර්ඝ කාලයක් දුක් අත්විඳින ලදී. දැඩි දුක් විඳින ලදී. ව්‍යසන විඳින ලදී. සොහොන් බිම වඩන ලදී. එබැවින් සියලු සංස්කාරයන් කෙරෙහි කලකිරීමම සුදුසුය. නොඇලීමම සුදුසුය. මිදීමම සුදුසුය."

## 10. එකපුග්ගල සූත්‍රය

මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක භාග්‍යවතුන් වහන්සේ රජගහ නුවර ගිජුකුළු පව්වෙහි වැඩවසන සේක. එහිදි භාග්‍යවතුන් වහන්සේ "මහණෙනි"යි භික්ෂූන් ඇමතූ සේක. භික්ෂූහු "ස්වාමීනි"යි පිළිතුරු දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළ සේක.

"මහණෙනි, අවිද්‍යා නීවරණයෙන් වැසී, තණ්හා සංයෝජනයෙන් බැඳී, දුවන්නාවු, සැරිසරන්නාවු සත්ත්වයන්ගේ සිතාගත නොහැකි අග කෙළවරක් ඇති මේ සංසාර ගමනෙහි අතීත කෙළවරද නොපෙනේ. මහණෙනි, කල්පයක් පුරා මෙසේ දුවන්නාවු සැරිසරන්නාවු එක් පුද්ගලයෙකුගේ ඇට සැකිල්ල, ඇට රාශිය, ඇට ගොඩ එක්රැස්කර කරන්නෙක් වන්නේ නම්, රැස්කරන ලද්ද විනාශ නොවේනම්, මේ වේපුල්ල පර්වතයට සමාන වන්නේය. ඒ කවර හෙයින්ද?

මහණෙනි, අවිද්‍යා නීවරණයෙන් වැසී, තණ්හා සංයෝජනයෙන් බැඳී දුවන්නාවූ සැරිසරන්නාවූ සත්ත්වයින්ගේ සිතාගත නොහැකි අග කෙළවරක් ඇති මේ සංසාර ගමනෙහි අතීත කෙළවර නොපෙනේ.

මහණෙනි, මෙසේ ඔබ විසින් දීර්ඝ කාලයක් දුක් අත්විඳින ලදී. දැඩි දුක් විඳින ලදී. ව්‍යසන විඳින ලදී. සොහොන් බිම වඩන ලදී. එබැවින් සියලු සංස්කාරයන් කෙරෙහි කලකිරීමම සුදුසුය. නොඇලීමම සුදුසුය. මිදීමම සුදුසුය." භාග්‍යවතුන් වහන්සේ මෙසේ දේශනා කළ සේක. ඊට අනතුරුව මේ ගාථාද වදාළ සේක.

1. එක කල්පයක් තුළ එක පුද්ගලයකුගේ ඇටගොඩ ප්‍රමාණයෙන් වේපුල්ල පර්වතය හා සමාන වන්නේය. මෙය මහා ඍෂිවූ බුදුරජාණන් වහන්සේ වදාළ සේක.

2. එසේ කියන ලද මහා වේපුල්ල පර්වතය මගධ ජනපදයේ ගිරිපබ්බජයෙහි ගිජ්ඣකූට පර්වතයට උතුරින් පිහිටි බව කියන ලදී.

3. යම් කලෙක යමෙක් දුක, දුක හටගැනීම, දුකින් මිදීම, දුකින් මිදීම සඳහා වන අරිඅටගි මග යන ආර්ය සත්‍යයන් මනා නුවණින් දකීද,

4. ඒ පුද්ගලයා වැඩිම වශයෙන් සත්වරක් සසර සැරිසරා සියලු සංයෝජන ක්ෂය කිරීමෙන් දුක කෙළවර කරන්නෙක් වේ.

# අනමතග්ග සංයුත්තය - දුග්ගත වග්ගය

## 1. දුග්ගත සූත්‍රය

මා විසින් මෙසේ අසන ලදී.

එක් සමයෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර අනාථ පිණ්ඩික සිටුහුගේ ජේතවන නම් ආරාමයෙහි වැඩ වසන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ "මහණෙනි" යි භික්ෂූන් ඇමතූ සේක. ඒ භික්ෂූහු "ස්වාමීනි"යි පිළිතුරු දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළ සේක.

"මහණෙනි, අවිද්‍යා නීවරණයෙන් වැසී, තණ්හා සංයෝජනයෙන් බැඳී දුවන්නාවූ සැරිසරන්නාවූ සත්ත්වයින්ගේ සිතාගත නොහැකි අග කෙළවරක් ඇති මේ සංසාර ගමනෙහි අතීත කෙළවර නොපෙනේ.

මහණෙනි, යම් හෙයකින් ඔබ දිළිඳු බවින්, විරූපී බවින් පීඩිතවූවකු දුටුවහොත් මෙසේ නිගමනය කළ යුතුය.

මේ දීර්ඝ කාලය තුළ අප විසින්ද මෙවැනි අවස්ථාවන් අත්විඳින ලදී. ඒ කවර හෙයින්ද?

මහණෙනි, අවිද්‍යා නීවරණයෙන් වැසී, තණ්හා සංයෝජනයෙන් බැඳී දුවන්නාවූ සැරිසරන්නාවූ සත්ත්වයින්ගේ සිතාගත නොහැකි අග කෙළවරක් ඇති මේ සංසාර ගමනෙහි අතීත කෙළවර නොපෙනේ.

මහණෙනි, මෙසේ ඔබ විසින් දීර්ඝ කාලයක් දුක් අත්විඳින ලදී. දැඩි දුක් විඳින ලදී. ව්‍යසන විඳින ලදී. සොහොන් බිම වඩන ලදී. එබැවින් සියලු සංස්කාරයන් කෙරෙහි කලකිරීමම සුදුසුය. නොඇලීමම සුදුසුය. මිදීමම සුදුසුය."

## 2. සුඛිත සූත්‍රය

මා විසින් මෙසේ අසන ලදී.

එක් සමයෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර අනාථ පිණ්ඩික සිටුහුගේ ජේතවන නම් ආරාමයෙහි වැඩවසන සේක. එහිදී

භාග්‍යවතුන් වහන්සේ "මහණෙනි"යි භික්ෂූන් ඇමතූ සේක. ඒ භික්ෂූහු "ස්වාමීනි"යි පිළිතුරු දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළ සේක.

"මහණෙනි, අවිද්‍යා නීවරණයෙන් වැසී, තණ්හා සංයෝජනයෙන් බැඳී දුවන්නාවූ සැරිසරන්නාවූ සත්ත්වයින්ගේ සිතාගත නොහැකි අග කෙළවරක් ඇති මේ සංසාර ගමනෙහි අතීත කෙළවර නොපෙනේ.

මහණෙනි, ඔබ යම් හෙයකින් සුවපත්වූ, මනාව සැරසුනාවූ ඉතා සැපයෙන් සිටින කෙනෙකු දුටුවහොත් මෙසේ නිගමනය කළ යුතුවේ. "මේ දීර්ඝ කාලය තුළ අප විසින්ද මෙවැනි අවස්ථාවන් අත්විඳින ලදී." ඒ කවර හෙයින්ද?

මහණෙනි, අවිද්‍යා නීවරණයෙන් වැසී, තණ්හා සංයෝජනයෙන් බැඳී දුවන්නාවූ සැරිසරන්නාවූ සත්ත්වයින්ගේ සිතාගත නොහැකි අග කෙළවරක් ඇති මේ සංසාර ගමනෙහි අතීත කෙළවර නොපෙනේ.

මහණෙනි, මෙසේ ඔබ විසින් දීර්ඝ කාලයක් දුක් අත්විඳින ලදී. දැඩි දුක් විඳින ලදී. ව්‍යසන විඳින ලදී. සොහොන් බිම වඩන ලදී. එබැවින් සියලු සංස්කාරයන් කෙරෙහි කලකිරීමම සුදුසුය. නොඇලීමම සුදුසුය. මිදීමම සුදුසුය."

## 3. තිංසමත්ත සූත්‍රය

මා විසින් මෙසේ අසන ලදී.

එක් සමයෙක භාග්‍යවතුන් වහන්සේ රජගහ නුවර වේළුවනයෙහි (උණ වනයෙහි) වැඩවසන සේක. එකල්හි පාවා නුවර වාසය කළ සියලු දෙනාම ආරණ්‍යවාසීවූද, පිණ්ඩපාතයෙන්ම යැපෙන්නාවූද, පංසුකූලික සිවුරුම පරිහරණය කරන්නාවූද, තුන් සිවුරම දරන්නාවූද, සංයෝජන සහිතවූ තිස්නමක් පමණ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹ උන්වහන්සේට වැඳ එකත්පසෙක හිඳගත්හ.

එකල්හි භාග්‍යවතුන් වහන්සේට මෙවන් සිතක් පහළ විය. "මේ තිහක් පමණවූ සියලුම පාවා නුවර වැසි භික්ෂූහු ආරණ්‍යක වෙති. පිණ්ඩපාතික වෙති. පංසුකූලික වෙති. තෙචීවරික වෙති. සියල්ලෝම සංයෝජන සහිත වෙති. යම්සේ මේ අසුනේදීම ඔවුන්ගේ සිත් තුළින්

උපාදනය පහවී ආශ්‍රවයන්ගෙන් මිදේද මම එවැනිවූ ධර්මයක් දේශනා කරන්නෙම් නම් මැනවි”

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ “මහණෙනි”යි භික්ෂූන් ඇමතූ සේක. ඒ භික්ෂූහු “ස්වාමීනි”යි පිළිතුරු දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළ සේක.

“මහණෙනි, අවිද්‍යා නීවරණයෙන් වැසී, තණ්හා සංයෝජනයෙන් බැඳී දුවන්නාවූ සැරිසරන්නාවූ සත්ත්වයින්ගේ සිතාගත නොහැකි අග කෙළවරක් ඇති මේ සංසාර ගමනෙහි අතීත කෙළවර නොපෙනේ. ඔබ කුමක් සිතන්නෙහුද? මහණෙනි, මෙවන් දීර්ඝ කාලයක් පුරා දුවන්නාවූ සැරිසරන්නාවූ ඔබගේ හිස් සිඳීමෙන් වැගිරුනාවූ යම් පමණ ලෙයක් වේද, සතර මහා සාගරයේ යම් පමණ ජලයක් වෙද, එයින් කුමක් අධිකතර වේද?”

“ස්වාමීනි, අප ඔබ වහන්සේගෙන් ධර්මය අසා දැනගත් පරිදි අප දීර්ඝ කාලයක් සසර දුවන සැරිසරන අතර හිස සිඳීමෙන් වැගිරුණාවූ යම් පමණ ලෙයක් වේද, එයම වඩා වැඩිවේ. සතර මහා සාගරයේ ජලය (ඊට) වඩා වැඩි නොවේ.”

“යහපති, යහපති, මහණෙනි, ඔබ මා විසින් දෙසන ලද ධර්මය තේරුම් ගත් අයුරු යහපත්ය. ඒකාන්තයෙන්ම මහණෙනි දීර්ඝ කාලයක් දුවන සැරිසරන අතර ඔබගේ හිස් සිඳීමෙන් වැගිරුණාවූ යම් ලෙයක් වේද, එයම ඉතාම වැඩිය. සතර මහා සාගරයේ ජලය (ඊට) වැඩි නොවේ.

“මහණෙනි, දීර්ඝ කාලයක් මුළුල්ලෙහි ගව ජාතියෙහි ගවයන්ව ඉපිද, මහීෂ ජාතියෙහි මී ගොන්ව ඉපිද, එළු ජාතියෙහි එළුවන්ව ඉපිද, තිරෙළු ජාතියෙහි තිරෙළුවන්ව ඉපිද, මුව ජාතියෙහි මුවන්ව ඉපිද, සූකර ජාතියෙහි සූකරයන්ව ඉපිද, කුකුළු ජාතියෙහි කුකුළන්ව ඉපිද දීර්ඝ කාලයක් දුවන සැරිසරන අතර ඔබගේ හිස් සිඳීමෙන් වැගිරුණාවූ යම් ලෙයක් වේද, එයම වඩා වැඩිය. සතර මහා සාගරයේ ජලය (ඊට) වඩා වැඩි නොවේ.

මහණෙනි, දීර්ඝ කාලයක් මුළුල්ලෙහි ගම් පහරන සොරුන් යයි අල්වාගෙන, මං පහරන සොරුන් යයි අල්වාගෙන, අන් අඹුවන් ඇසුරු කරන සොරුන් යයි අල්වාගෙන ඔබගේ හිස් සිඳීමෙන් වැගිරුණාවූ යම්

ලෙයක් වේද, එයම ඊට වැඩිය. සතර මහා සාගරයේ ජලය (ඊට) වඩා වැඩි නොවේ. ඒ කවර හෙයින්ද?

මහණෙනි, අවිද්‍යා නීවරණයෙන් වැසී, තණ්හා සංයෝජනයෙන් බැඳී දුවන්නාවූ සැරිසරන්නාවූ සත්ත්වයින්ගේ සිතාගත නොහැකි අග කෙළවරක් ඇති මේ සංසාර ගමනෙහි අතීත කෙළවර නොපෙනේ.

මහණෙනි, මෙසේ ඔබ විසින් දීර්ඝ කාලයක් දුක් අත්විඳින ලදී. දැඩි දුක් විඳින ලදී. ව්‍යසන විඳින ලදී. සොහොන් බිම වඩන ලදී. එබැවින් සියලු සංස්කාරයන් කෙරෙහි කලකිරීමම සුදුසුය. නොඇලීමම සුදුසුය. මිදීමම සුදුසුය."

භාග්‍යවතුන් වහන්සේ මෙය දේශනා කළ සේක. සතුටු සිත් ඇති ඒ භික්ෂූහු අතිශයින්ම ඒ දේශනාව කෙරෙහි පැහැදුනාහ. එම දේශනාව පැවැත්වෙන අතරතුර තිහක් පමණවූ ඒ පවා නුවරවැසි භික්ෂූන්ගේ සිත් උපාදන රහිතවී ආශ්‍රවයන්ගෙන් මිදුනේය."

## 4. මාතු සූත්‍රය

මා විසින් මෙසේ අසන ලදී.

එක් සමයෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර අනාථපිණ්ඩික සිටුහුගේ ජේතවන නම් ආරාමයෙහි වැඩවසන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ "මහණෙනි"යි භික්ෂූන් ඇමතූ සේක. ඒ භික්ෂූහු "ස්වාමීනි"යි පිළිතුරු දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළ සේක.

"මහණෙනි, අවිද්‍යා නීවරණයෙන් වැසී, තණ්හා සංයෝජනයෙන් බැඳී දුවන්නාවූ සැරිසරන්නාවූ සත්ත්වයින්ගේ සිතාගත නොහැකි අග කෙළවරක් ඇති මේ සංසාර ගමනෙහි අතීත කෙළවර නොපෙනේ.

මහණෙනි, මේ දීර්ඝ කාලය ඇතුළත ඔබට මවක නොවූ සත්ත්වයෙකු සොයා ගැනීම පහසු නොවේ. ඒ කවර හෙයින්ද?

මහණෙනි, අවිද්‍යා නීවරණයෙන් වැසී, තණ්හා සංයෝජනයෙන් බැඳී දුවන්නාවූ සැරිසරන්නාවූ සත්ත්වයින්ගේ සිතාගත නොහැකි අග කෙළවරක් ඇති මේ සංසාර ගමනෙහි අතීත කෙළවර නොපෙනේ.

මහණෙනි, මෙසේ ඔබ විසින් දීර්ඝ කාලයක් දුක් අත්විඳින ලදී. දැඩි දුක් විඳින ලදී. ව්‍යසන විඳින ලදී. සොහොන් බිම වඩන ලදී. එබැවින් සියලු සංස්කාරයන් කෙරෙහි කලකිරීමම සුදුසුය. නොඇලීමම සුදුසුය. මිදීමම සුදුසුය.”

## 5. පිතු සූත්‍රය

මා විසින් මෙසේ අසන ලදී.

එක් සමයෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර අනාථපිණ්ඩික සිටුහුගේ ජේතවනාරාමයෙහි වැඩවසන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ “මහණෙනි”යි භික්ෂූන් ඇමතූ සේක. ඒ භික්ෂූහු “ස්වාමීනි”යි පිළිතුරු දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළ සේක.

“මහණෙනි, අවිද්‍යා නීවරණයෙන් වැසී, තණ්හා සංයෝජනයෙන් බැඳී දුවන්නාවූ සැරිසරන්නාවූ සත්ත්වයින්ගේ සිතාගත නොහැකි අග කෙළවරක් ඇති මේ සංසාර ගමනෙහි අතීත කෙළවර නොපෙනේ.

මහණෙනි, මේ දීර්ඝ කාලය ඇතුළත ඔබට පියෙකු නොවූ සත්ත්වයෙකු සොයා ගැනීම පහසු නොවේ. ඒ කවර හෙයින්ද?

මහණෙනි, අවිද්‍යා නීවරණයෙන් වැසී, තණ්හා සංයෝජනයෙන් බැඳී දුවන්නාවූ සැරිසරන්නාවූ සත්ත්වයින්ගේ සිතාගත නොහැකි අග කෙළවරක් ඇති මේ සංසාර ගමනෙහි අතීත කෙළවර නොපෙනේ.

මහණෙනි, මෙසේ ඔබ විසින් දීර්ඝ කාලයක් දුක් අත්විඳින ලදී. දැඩි දුක් විඳින ලදී. ව්‍යසන විඳින ලදී. සොහොන් බිම වඩන ලදී. එබැවින් සියලු සංස්කාරයන් කෙරෙහි කලකිරීමම සුදුසුය. නොඇලීමම සුදුසුය. මිදීමම සුදුසුය.”

## 6. භාතු සූත්‍රය

මා විසින් මෙසේ අසන ලදී.

එක් සමයෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර අනාථපිණ්ඩික සිටුහුගේ ජේතවනාරාමයෙහි වැඩවසන සේක. එහිදී

භාග්‍යවතුන් වහන්සේ "මහණෙනි"යි භික්ෂූන් ඇමතූ සේක. ඒ භික්ෂූහු "ස්වාමීනි"යි පිළිතුරු දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළ සේක.

"මහණෙනි, අවිද්‍යා නීවරණයෙන් වැසී, තණ්හා සංයෝජනයෙන් බැඳී දුවන්නාවූ සැරිසරන්නාවූ සත්ත්වයින්ගේ සිතාගත නොහැකි අග කෙළවරක් ඇති මේ සංසාර ගමනෙහි අතීත කෙළවර නොපෙනේ.

මහණෙනි, මේ දීර්ඝ කාලය ඇතුළත ඔබට සොහොයුරකු නොවූ සත්ත්වයෙකු සොයා ගැනීම පහසු නොවේ. ඒ කවර හෙයින්ද?

මහණෙනි, අවිද්‍යා නීවරණයෙන් වැසී, තණ්හා සංයෝජනයෙන් බැඳී දුවන්නාවූ සැරිසරන්නාවූ සත්ත්වයින්ගේ සිතාගත නොහැකි අග කෙළවරක් ඇති මේ සංසාර ගමනෙහි අතීත කෙළවර නොපෙනේ.

මහණෙනි, මෙසේ ඔබ විසින් දීර්ඝ කාලයක් දුක් අත්විඳින ලදී. දැඩි දුක් විඳින ලදී. ව්‍යසන විඳින ලදී. සොහොන් බිම වඩන ලදී. එබැවින් සියලු සංස්කාරයන් කෙරෙහි කලකිරීමම සුදුසුය. නොඇලීමම සුදුසුය. මිදීමම සුදුසුය."

## 7. භගිනි සූත්‍රය

මා විසින් මෙසේ අසන ලදී.

එක් සමයෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර අනාථපිණ්ඩික සිටුහුගේ ජේතවන නම් ආරාමයෙහි වැඩවසන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ "මහණෙනි"යි භික්ෂූන් ඇමතූ සේක. ඒ භික්ෂූහු "ස්වාමීනි"යි පිළිතුරු දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළ සේක.

"මහණෙනි, අවිද්‍යා නීවරණයෙන් වැසී, තණ්හා සංයෝජනයෙන් බැඳී දුවන්නාවූ සැරිසරන්නාවූ සත්ත්වයින්ගේ සිතාගත නොහැකි අග කෙළවරක් ඇති මේ සංසාර ගමනෙහි අතීත කෙළවර නොපෙනේ.

මහණෙනි, මේ දීර්ඝ කාලය ඇතුළත ඔබට සොහොයුරියක නොවූ සත්ත්වයෙකු සොයා ගැනීම පහසු නොවේ. ඒ කවර හෙයින්ද?

මහණෙනි, අවිද්‍යා නීවරණයෙන් වැසී, තණ්හා සංයෝජනයෙන් බැඳී දුවන්නාවූ සැරිසරන්නාවූ සත්ත්‍වයින්ගේ සිතාගත නොහැකි අග කෙළවරක් ඇති මේ සංසාර ගමනෙහි අතීත කෙළවර නොපෙනේ.

මහණෙනි, මෙසේ ඔබ විසින් දීර්ඝ කාලයක් දුක් අත්විඳින ලදී. දැඩි දුක් විඳින ලදී. ව්‍යසන විඳින ලදී. සොහොන් බිම වඩන ලදී. එබැවින් සියලු සංස්කාරයන් කෙරෙහි කලකිරීමම සුදුසුය. නොඇලීමම සුදුසුය. මිදීමම සුදුසුය."

## 8. පුත්ත සූත්‍රය

මා විසින් මෙසේ අසන ලදී.

එක් සමයෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර අනාථපිණ්ඩික සිටුහුගේ ජේතවනාරාමයෙහි වැඩවසන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ "මහණෙනි"යි භික්ෂූන් ඇමතූ සේක. ඒ භික්ෂූහු "ස්වාමීනි"යි පිළිතුරු දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළ සේක.

"මහණෙනි, අවිද්‍යා නීවරණයෙන් වැසී, තණ්හා සංයෝජනයෙන් බැඳී දුවන්නාවූ සැරිසරන්නාවූ සත්ත්‍වයින්ගේ සිතාගත නොහැකි අග කෙළවරක් ඇති මේ සංසාර ගමනෙහි අතීත කෙළවර නොපෙනේ.

මහණෙනි, මේ දීර්ඝ කාලය ඇතුළත ඔබට පුතකු නොවූ සත්ත්‍වයෙකු සොයා ගැනීම පහසු නොවේ. ඒ කවර හෙයින්ද?

මහණෙනි, අවිද්‍යා නීවරණයෙන් වැසී, තණ්හා සංයෝජනයෙන් බැඳී දුවන්නාවූ සැරිසරන්නාවූ සත්ත්‍වයින්ගේ සිතාගත නොහැකි අග කෙළවරක් ඇති මේ සංසාර ගමනෙහි අතීත කෙළවර නොපෙනේ.

මහණෙනි, මෙසේ ඔබ විසින් දීර්ඝ කාලයක් දුක් අත්විඳින ලදී. දැඩි දුක් විඳින ලදී. ව්‍යසන විඳින ලදී. සොහොන් බිම වඩන ලදී. එබැවින් සියලු සංස්කාරයන් කෙරෙහි කලකිරීමම සුදුසුය. නොඇලීමම සුදුසුය. මිදීමම සුදුසුය."

## 9. ධීතු සූත්‍රය

මා විසින් මෙසේ අසන ලදී.

එක් සමයෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර අනාථපිණ්ඩික සිටුහුගේ ජේතවනාරාමයෙහි වැඩවසන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ "මහණෙනි"යි භික්ෂූන් ඇමතූ සේක. ඒ භික්ෂූහු "ස්වාමීනි"යි පිළිතුරු දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළ සේක.

"මහණෙනි, අවිද්‍යා නීවරණයෙන් වැසී, තණ්හා සංයෝජනයෙන් බැඳී දුවන්නාවූ සැරිසරන්නාවූ සත්ත්වයින්ගේ සිතාගත නොහැකි අග කෙළවරක් ඇති මේ සංසාර ගමනෙහි අතීත කෙළවර නොපෙනේ.

මහණෙනි, මේ දීර්ඝ කාලය ඇතුළත ඔබට දියණියක නොවූ සත්ත්වයෙකු සොයා ගැනීම පහසු නොවේ. ඒ කවර හෙයින්ද?

මහණෙනි, අවිද්‍යා නීවරණයෙන් වැසී, තණ්හා සංයෝජනයෙන් බැඳී දුවන්නාවූ සැරිසරන්නාවූ සත්ත්වයින්ගේ සිතාගත නොහැකි අග කෙළවරක් ඇති මේ සංසාර ගමනෙහි අතීත කෙළවර නොපෙනේ.

මහණෙනි, මෙසේ ඔබ විසින් දීර්ඝ කාලයක් දුක් අත්විඳින ලදී. දැඩි දුක් විඳින ලදී. ව්‍යසන විඳින ලදී. සොහොන් බිම වඩන ලදී. එබැවින් සියලු සංස්කාරයන් කෙරෙහි කලකිරීමම සුදුසුය. නොඇලීමම සුදුසුය. මිදීමම සුදුසුය."

## 10. වෙපුල්ලපබ්බත සූත්‍රය

මා විසින් මෙසේ අසන ලදී.

එක් සමයෙක භාග්‍යවතුන් වහන්සේ රජගහ නුවර ගිජුකුළු පව්වෙහි වැඩවසන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ "මහණෙනි"යි භික්ෂූන් ඇමතූ සේක. ඒ භික්ෂූහු "ස්වාමීනි"යි පිළිතුරු දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළ සේක.

"මහණෙනි, අවිද්‍යා නීවරණයෙන් වැසී, තණ්හා සංයෝජනයෙන් බැඳී දුවන්නාවූ සැරිසරන්නාවූ සත්ත්වයින්ගේ සිතාගත නොහැකි අග කෙළවරක් ඇති මේ සංසාර ගමනෙහි අතීත කෙළවර නොපෙනේ.

මහණෙනි, අතීත සිදුවීමක් පවසමි. මේ වේපුල්ල පර්වතයට 'පාචීනපංස' යන නාමය ව්‍යවහාර විය. එසමයෙහි මිනිසුන් හැඳින්වූයේ 'තිවරා' නාමයෙනි. තිවරා මනුෂ්‍යයන්ගේ ආයු ප්‍රමාණ අවුරුදු හතලිස් දහසක් විය. තිවරා මනුෂ්‍යයෝ සිවු දිනකින් 'පාචීනවංස' පර්වතය නගිති. සිවු දිනකින් බසිති.

ඒ සමයෙහි වනාහි භාග්‍යවත් අරහත් කකුසඳ නම් සම්මා සම්බුදුරජාණන් වහන්සේ ලොව පහළවූ සේක. උන්වහන්සේට 'විධුර' හා 'සංජීව' නමින් අග්‍රවූ, ඉතා යහපත්වූ ශ්‍රාවක දෙනමක්වූහ. බලව මහණෙනි, මේ පර්වතයේ නාමය අතුරුදහන් විය. ඒ මනුෂ්‍යයෝද කළුරිය කළහ. ඒ භාග්‍යවතුන් වහන්සේද පිරිනිවි සේක. සංස්කාරයෝ මෙසේ අනිත්‍ය වෙති. සංස්කාරයෝ මෙසේ අස්ථිර වෙති. සංස්කාරයෝ මෙසේ අස්වැසිල්ලෙන් තොර වෙති. මේ සියලු සංස්කාරයන් කෙරෙහි කලකිරීමට සුදුසුය. නොඇලීමම සුදුසුය. මිදීමම සුදුසුය.

මහණෙනි, අතීත සිදුවීමක් පවසමි. මේ වේපුල්ල පර්වතයට 'වංකක' යන නාමය ව්‍යවහාර විය. එසමයෙහි මිනිසුන් හැඳින්වූයේ 'රොහිතස්ස' නාමයෙනි. රොහිතස්ස මනුෂ්‍යයින්ගේ ආයු ප්‍රමාණය අවුරුදු තිස් දහසක් විය. රොහිතස්ස මනුෂ්‍යයෝ තෙදිනකින් වංකක පර්වතය නගිති. තෙදිනකින් බසිති.

ඒ සමයෙහි වනාහි භාග්‍යවත් අර්හත් කෝණාගමන නම්වූ සම්මා සම්බුදුරාජාණන් වහන්සේ ලොව පහළවූ සේක. උන්වහන්සේට 'භිය්‍ය' හා 'සුත්තර' නමින් අග්‍රවූ, ඉතා යහපත්වූ ශ්‍රාවක දෙනමක්වූහ. බලව මහණෙනි, මේ පර්වතයේ නාමයද අතුරුදන් විය. ඒ මනුෂ්‍යයෝද කළුරිය කළහ. ඒ භාග්‍යවතුන් වහන්සේද පිරිනිවි සේක. සංස්කාරයෝ මෙසේ අනිත්‍ය වෙති. සංස්කාරයෝ මෙසේ අස්ථිර වෙති. සංස්කාරයෝ මෙසේ අස්වැසිල්ලෙන් තොර වෙති. මේ සියලු සංස්කාරයන් කෙරෙහි කලකිරීමට සුදුසුය. නොඇලීමම සුදුසුය. මිදීමම සුදුසුය.

මහණෙනි, අතීත සිදුවීමක් පවසමි. මේ වේපුල්ල පර්වතයට 'සුඵස්ස' යන නාමය ව්‍යවහාර විය. එසමයෙහි මිනිසුන් හැඳින්වූයේ 'සුප්පිය' නාමයෙනි. සුප්පිය මනුෂ්‍යයින්ගේ ආයු ප්‍රමාණය අවුරුදු විසි දහසක් විය. සුප්පිය මනුෂ්‍යයෝ දෙදිනකින් වංකක පර්වතය නගිති. දෙදිනකින් බසිති.

ඒ සමයෙහි වනාහි භාග්‍යවත් අර්හත් කාශ්‍යප නම්වූ සම්මා සම්බුදුරාජණන් වහන්සේ ලොව පහළවූ සේක. උන්වහන්සේට 'තිස්ස' හා 'භාරද්වාජ' නමින් අග්‍රවූ, ඉතා යහපත්වූ ශ්‍රාවක දෙනමක්වූහ. බලව මහණෙනි, මේ පර්වතයේ නාමයද අතුරුදන් විය. ඒ මනුෂ්‍යයෝද කළුරිය කළහ. ඒ භාග්‍යවතුන් වහන්සේද පිරිනිවි සේක. සංස්කාරයෝ මෙසේ අනිත්‍ය වෙති. සංස්කාරයෝ මෙසේ අස්ථිර වෙති. සංස්කාරයෝ මෙසේ අස්වැසිල්ලෙන් තොර වෙති. මේ සියලු සංස්කාරයන් කෙරෙහි කලකිරීමට සුදුසුය. නොඇලීමම සුදුසුය. මිදීමම සුදුසුය.

මහණෙනි, දැන් මේ පර්වතයට 'වේපුල්ල' නාමයම ව්‍යවහාර වේ. මෙහි වැසියන් හැඳින්වෙන්නේ 'මාගධක' නාමයෙනි. මහණෙනි, මාගධක මනුෂ්‍යයින්ගේ ආයු ප්‍රමාණය අල්පය. සුළුය. කෙටිය. දීර්ග ආයු කාලයක් ඇති අය වසර සියයක් හෝ ඉන් ස්වල්පයක් වැඩියෙන් හෝ ජීවත් වෙති. මාගධකයෝ මොහොතින් වේපුල්ල පර්වතය නගිති. මොහොතින් බසිති.

මේ සමයෙහි වනාහි භාග්‍යවත් අරහත් සම්මා සම්බුද්ධවූ මම ලෝකයෙහි උපන්නේ වෙමි. මට 'සාරිපුත්ත', 'මොග්ගල්ලාන' නමින් අග්‍රවූ, ඉතා යහපත්වූ ශ්‍රාවක දෙනමක් වෙති.

මේ පර්වතයේ නාමයද අතුරුදන් වීමට මෙය කාලය වෙයි. මේ මනුෂ්‍යයෝත් කළුරිය කරන්නාහ. මමත් පිරිනිවෙන්නෙමි. මහණෙනි, සංස්කාරයෝ මෙසේ අනිත්‍ය වෙති. සංස්කාරයෝ මෙසේ අස්ථිර වෙති. සංස්කාරයෝ මෙසේ අස්වැසිල්ලෙන් තොර වෙති. මහණෙනි, මේ සියලු සංස්කාරයන් කෙරෙහි කලකිරීමට සුදුසුය. නොඇලීමම සුදුසුය. මිදීමම සුදුසුය.

භාග්‍යවත්වූ, සුගතවූ, ශාස්තෘන් වහන්සේ මෙසේ වදරා නැවතද මෙසේ වදාළ සේක.

තිවරයන්ට පාචීනවංස විය. රොහිතස්සයන්ට වංකක විය. සුප්පියයන්ට සුඵස්ස විය. මාගධයන්ට වෙපුල්ල විය.

සංස්කාරයෝ ඒකාන්තයෙන්ම අනිත්‍යයහ. ඉපිද - නැතිවන ස්වභාවය උරුමකොට ඇත්තාහ. ඉපිද නිරුද්ධ වෙති. ඔවුන්ගේ සංසිඳීමම සුවය වේ."

## කතු හිමියන්ගේ සිංහල කෘති

සැ.යු.: මෙම කෘති ලේඛනය සරලත්‍වයට මුල් තැන දුන් අංක අනුපිළිවෙලක් සහිතව සකස්වී ඇති බවත්, ලේඛනයේ අගහරියේ එන කෘති බොහෝ දුරට ගැඹුරු විය හැකි බවත්, පාඨකයින් දැනුවත් කිරීම් වශයෙන් සඳහන් කරනු කැමැත්තෙමි.

- සම්පාදක

1. තිසරණ මහිම
2. හිතක මහිම – 1
3. හිතක මහිම – 2
4. හිතක මහිම – 3
5. හිතක මහිම (1-3 වෙළුම්)
6. දිවි කතරේ සැඳෑ අඳුර
7. කය අනුව ගිය සිහිය
8. හිත තැනීම
9. පින් රුකෙක මහිම
10. අබිනික්මන
11. පිළිවෙතින් පිළිවෙතට
12. කයේ කතාව
13. මා-පිය උවැටන
14. ප්‍රතිපත්ති පූජාව
15. පැවැත්ම හා නැවැත්ම
16. කර්ම චක්‍රයෙන් ධර්ම චක්‍රයට
17. මෙත් සිතේ විමුක්තිය
18. ඇති හැටි දැක්ම
19. තපෝ ගුණ මහිම
20. සක්මනේ නිවන
21. පහන් කණුව ධර්ම දේශනා – 1 වෙළුම
22. පහන් කණුව ධර්ම දේශනා – 2 වෙළුම
23. පහන් කණුව ධර්ම දේශනා – 3 වෙළුම
24. පහන් කණුව ධර්ම දේශනා – 4 වෙළුම
25. පහන් කණුව ධර්ම දේශනා – 5 වෙළුම
26. පහන් කණුව ධර්ම දේශනා – 6 වෙළුම

27. පහන් කණුව ධර්ම දේශනා – 7 වෙළුම
28. පහන් කණුව ධර්ම දේශනා – 8 වෙළුම
29. පහන් කණුව ධර්ම දේශනා – 9 වෙළුම
30. පහන් කණුව ධර්ම දේශනා – 10 වෙළුම
31. පහන් කණුව ධර්ම දේශනා – 11 වෙළුම
32. පහන් කණුව ධර්ම දේශනා – 12 වෙළුම
33. පහන් කණුව ධර්ම දේශනා – 13 වෙළුම
34. පහන් කණුව ධර්ම දේශනා – 14 වෙළුම
35. පහන් කණුව ධර්ම දේශනා – 15 වෙළුම
36. පහන් කණුව ධර්ම දේශනා – 16 වෙළුම
37. පහන් කණුව ධර්ම දේශනා – 17 වෙළුම
38. පහන් කණුව ධර්ම දේශනා – 18 වෙළුම
39. පහන් කණුව ධර්ම දේශනා – 19 වෙළුම
40. පහන් කණුව ධර්ම දේශනා – 20 වෙළුම
41. සබ්බාසව සූත්‍රයේ මැදුම් මග
42. විදසුන් උපදෙස්
43. භාවනා මාර්ගය
44. උත්තරීතර හුදෙකළාව
45. සසුන් පිළිවෙත
46. චලන චිත්‍රය
47. දිය සුළිය
48. බුදු සමය පුද්ගලයා හා සමාජය
49. නිවනේ නිවීම – පළමු වෙළුම
50. නිවනේ නිවීම – දෙවන වෙළුම
51. නිවනේ නිවීම – තෙවන වෙළුම
52. නිවනේ නිවීම – සිවුවන වෙළුම
53. නිවනේ නිවීම – පස්වන වෙළුම
54. නිවනේ නිවීම – සයවන වෙළුම
55. නිවනේ නිවීම – සත්වන වෙළුම
56. නිවනේ නිවීම – අටවන වෙළුම
57. නිවනේ නිවීම – නවවන වෙළුම
58. නිවනේ නිවීම – දසවන වෙළුම

59. නිවනේ නිවීම – එකොළොස්වන වෙළුම

60. නිවනේ නිවීම – පුස්තකාල මුද්‍රණය (1-11 වෙළුම්)

61. පටිච්ච සමුප්පාද ධර්මය – 1 වෙළුම

62. පටිච්ච සමුප්පාද ධර්මය – 2 වෙළුම

63. පටිච්ච සමුප්පාද ධර්මය – 3 වෙළුම

64. පටිච්ච සමුප්පාද ධර්මය – 4 වෙළුම

65. පටිච්ච සමුප්පාද ධර්මය – පුස්තකාල මුද්‍රණය (1-4 වෙළුම්)

66. ස්පර්ශයේ ආශ්චර්යය

67. මනසේ මායාව

68. පැරණි බෞද්ධ චින්තාවේ සංකල්පය සහ යථාර්ථය

---

නැවත මුද්‍රණය කරවීම පිළිබඳ විමසීම්:
කටුකුරුන්දේ ඤාණනන්ද සදහම් සෙනසුන් භාරය
කිරිල්ලවලවත්ත, දම්මුල්ල, කරඳන
දුරකථනය: 0777127454

knssb@seeingthroughthenet.net

# By The Same Author

1. Concept and Reality in Early Buddhist Thought
2. Saṁyutta Nikāya – An Anthology
3. Ideal Solitude
4. The Magic of the Mind
5. Towards Calm and Insight
6. From Topsy-turvydom to Wisdom, Volume I
7. From Topsy-turvydom to Wisdom, Volume II
8. Seeing Through
9. Towards A Better World
10. Nibbāna – The Mind Stilled, Volume I
11. Nibbāna – The Mind Stilled, Volume II
12. Nibbāna – The Mind Stilled, Volume III
13. Nibbāna – The Mind Stilled, Volume IV
14. Nibbāna – The Mind Stilled, Volume V
15. Nibbāna – The Mind Stilled, Volume VI
16. Nibbāna – The Mind Stilled, Volume VII
17. Nibbāna – The Mind Stilled, Library Edition
18. Nibbāna and The Fire Simile
19. A Majestic Tree of Merit
20. The End of the World in Buddhist Perspective
21. The Law of Dependent Arising, Volume I
22. The Law of Dependent Arising, Volume II
23. The Law of Dependent Arising, Volume III
24. The Law of Dependent Arising, Volume IV
25. The Law of Dependent Arising, Library Edition
26. Walk to Nibbāna
27. Deliverance of the Heart through Universal Love
28. Questions and Answers on Dhamma
29. The Miracle of Contact
30. From The Wheel of Kamma To The Wheel of Dhamma

---

All enquiries should be addressed to:
Kaṭukurunde Ñāṇananda Sadaham Senasun Bhāraya
Kirillawala Watta, Dammulla, Karandana
Phone: 0777127454
knssb@seeingthroughthenet.net